**රුහුණ විශ්වවිද්‍යාලය - 2015**
**---------------------------------**

රුහුණ විශ්වවිද්‍යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශිෂ්‍යත්ව ලබාදීම වෙනුවෙන් ආරම්භ කර තිබුණු ඉතිරි කිරීමේ ගිණුම් 09 ක සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එකතුව රු. 2,970,929 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මුදල් හෝ මුදල් හා සමාන දෑ යටතේ දැක්වීම වෙනුවට දීර්ඝ කාලීන ආයෝජන යටතේ දක්වා තිබුණි.

(ii) ප්‍රාග්ධන වත්කම් ඉදිකිරීම සහ මිලදී ගැනීම සඳහා විශ්වවිද්‍යාල අරමුදලින් වැයකළ රු.153,236,034 ක මුදල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතිපූරණය කරන බවට තහවුරු කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii) ප්‍රමිති මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් විශ්වවිද්‍යාලය විසින් ප්‍රාග්ධන වියදම් සඳහා වැයකළ රු.153,236,034 ක මුදල වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රදාන ගිණුමෙන් එකිනෙකට හිලව් කිරීම නිසා රු.50,587,750 ක ඍණ ශේෂයක් දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,536,204 ක්වූ ඉතිරි නඩත්තු ද්‍රව්‍ය තොග, නඩත්තු කටයුතු සඳහා පවත්වාගෙන ගිය ද්‍රව්‍ය තොගය ලෙස හඳුනා ගැනීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ලියාහැර තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013, 2014 හා 2015 වර්ෂ තුළ ඉදිකිරීම් නිමකර විශ්වවිද්‍යාලයට භාර දී තිබුණු පිරිවැය රු. 234,043,340 ක් වූ ගොඩනැගිලි 06 ක වටිනාකම ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත නොකර තවදුරටත් කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණි. එම නිසා 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ක්ෂය කිරීමද කර නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට ගොවිපලේ විකිණීම සඳහා තිබුණු රු. 239,290 ක් වූ පැළ තොගයේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලය සතු දේපල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් ගෙවිය යුතු රු.869,224 ක්වූ වරිපනම් බදු හා අධිභාර ගිණුම් ගතකර නොතිබුණි.

**2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්**

මූලා ප්‍රකාශනවල දැක්වෙන ඉංජිනේරු පීඨයට අදාළ ත්‍යාග හා පරිත්‍යාග ගිණුමේ ශේෂය ඊට අදාළ උපලේඛනය සමඟ සැසඳීමේදී රු. 432,408 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2016 මාර්තු 31 දින දක්වා නිකුත් කරන ලද විගණන විමසුම් 92 කින් වටිනාකම රු. 872,232,218 ක් වූ විගණන විමසුම් 25 කට 2016 ජුනි 30 දක්වා පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සමඟ ඇතිකරගෙන තිබුණු ගිවිසුම් හා බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් වසර 01 සිට වසර 15 දක්වා කාලපරිච්ඡේදයෙක් තුළ ආචාර්යවරුන් 20 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු. 27,078,578 ක මුදලක් අයවිය යුතුව තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 01 සිට වසර 07 දක්වා වූ එකතුව රු.1,466,849 ක්වූ පර්යේෂණ හා බාහිර වැඩසටහන් සඳහා වූ අත්තිකාරම් 2016 ජුනි 30 දක්වා නිරවුල් කර නොතිබුණි.

**2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 හා 3.2 වගන්ති | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 478 දෙනෙකුගේ හා කාර්යය පැවරුම් පදනම මත සේවය කරන කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා වැටුප් හා දීමනා වශයෙන් පිළිවෙලින් එකතුව රු. 1,105,134,777 ක් සහ රු.1,415,806 ක් ගෙවා තිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 104 | සමාලෝචිත වර්ෂයේ සිදුවී තිබුණු රු. 322,290 ක වාහන අනතුරු දෙකක අලාභ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 1998 අගෝස්තු 18 දිනැති අංක 737 දරන චක්‍රලේඛය | ගිවිසුම් කඩකළ පුද්ගලයන්ගෙන් අයකරගෙන තිබුණු රු.41,896,466 ක් ස්ථාවර තැන්පතුවල හෝ භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කර නොතිබුණි. ඉකුත් වර්ෂයකදී එලෙස ආයෝජනය කරන ලද මුදල්වලින් ලැබී තිබූ රු.1,283,507 ක පොලිය චක්‍රලේඛයේ සඳහන් අරමුණුවලින් බැහැර වෙනත් කාර්යයන් සඳහා යොදවා තිබුණි. |
| (ii) 2015 සැප්තැම්බර් 18 දිනැති අංක 13/2015 දරන චක්‍රලේඛය | පීඨාධිපතිවරුන්ට ප්‍රවාහන පහසුකම් වෙනුවෙන් මාසිකව ලබා දෙන පෙට්‍රල් ලීටර් 140 ක සීමාව ඉක්මවා මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයාට පෙට්‍රල් ලීටර් 678 ක් වෙනුවෙන් රු. 79,326 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි. |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පිරිවැය රු. 8,438,459,798 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් විධිමත් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පිරිවැය රු. 206,132,592 ක් වූ පරිගණක සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 28,852,186 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 42,347,533 ක් වූයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.13,495,347 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙහෙයුම් ආදායම රු. 434,088,733 කින් වැඩි වුවද මුළු වියදම රු. 447,584,080 කින් වැඩි වීම ඉහත පිරිහීමට හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ අතිරික්තයක් වී තිබුණද 2012, 2013 වර්ෂ වලදී ඌනතාවයක්ද 2014 හා 2015 වර්ෂවල නැවත අතිරික්තයක්ද ඇති වී තිබුණි. කෙසේ වුවද සේවක පාරිශ්‍රමික, බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දායකත්වය පිරිහී තිබුණද ඉන්පසු වර්ෂවලදී ක්‍රමයෙන් වර්ධනය වී තිබුණි. ඒ අනුව 2014 වර්ෂයේදී රු.1,778,438,697 ක්වූ දායකත්වය සියයට 21 කින් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී රු.2,155,374,403 ක් වී තිබුණි.

**3.2 විශ්වවිද්‍යාලයට එරෙහිව හෝ විශ්වවිද්‍යාලය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

සමාලෝචිත වර්ෂයේ අවසානයට විශ්වවිද්‍යාලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ හා දිසා අධිකරණයේ නඩු 03 ක් ගොනු කර තිබූ අතර දිසා අධිකරණයේ පවරා තිබුණු නඩුවකින් රු. 5,760,894 ක් අය විය යුතුව තිබුණි. විශ්වවිද්‍යාලයට එරෙහිව විවිධ පාර්ශවයන් විසින් කම්කරු විනිශ්චය සභාවේ පැමිණිලි 13ක්, අධිකරණයේ නඩු 09 ක් හා විශ්වවිද්‍යාල අභියාචනා මණ්ඩලයේ පැමිණිලි 04 ක් ද වශයෙන් නඩු 26 ක් ගොනු කර තිබුණි. විශ්වවිද්‍යාලයට එරෙහිව පවරා තිබුණු නඩු දෙකකින් රු. 28,905,977 ක වන්දි මුදලක් ඉල්ලා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ආයතනයේ අරමුණු

විශ්වවිද්‍යාලය විසින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ වර්ෂ 05 සඳහා සකස් කර තිබුණු උපායමාර්ගික සැලසුමට අනුව ඉටුකර ගතයුතු ප්‍රධාන අරමුණු සාරාංශ කර පහත දැක්වේ.

(i) අධ්‍යාපන, පර්යේෂණ හා සේවාවන් සඳහා ප්‍රවේශයන් පුළුල් කිරීම, ගුණාත්මකභාවය වර්ධනය කිරීම හා අදාළත්වය වර්ධනය කිරීම.

(ii) ස්ත්‍රී පුරුෂභාවය, ආගම හා ජනවාර්ග, ආබාධිත පුද්ගලයන් සඳහා සාධාරණත්වය හා සමානාත්මතාවය තහවුරු කිරීම.

(iii) ඵලදායී හා කාර්යක්ෂම සම්පත් කළමනාකරණය තුළින් යහපාලනය වර්ධනය කිරීම.

(iv) විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වල මුල් 2000 අතරට පැමිණීම හා විශ්වවිද්‍යාලයේ අනන්‍යතාවය වර්ධන කිරීම.

ඉහත අරමුණු ඉටු කරගැනීම සම්බන්ධයෙන් සිදුකළ පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2014/2015 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් සිසුන් බඳවා ගැනීමේදී උපාධි පාඨමාලා 14 න් පාඨමාලා 11 ක් සඳහා බඳවා ගත හැකි සිසුන් සංඛ්‍යාවට වඩා සිසුන් 187 දෙනෙකු අඩුවෙන් ඇතුළත් කර ගෙන තිබුණි.

(ආ) <u>විද්‍යාපීඨය</u>

(i) පසුගිය අධ්‍යයන වර්ෂ 05 තුළ විද්‍යාපීඨයේ උපාධි පාඨමාලා තුන සඳහා ඇතුළත් කර ගත හැකිව තිබුණු සිසුන් සංඛ්‍යාවට වඩා සිසුන් 551 දෙනෙකු අඩුවෙන් ඇතුළත් කර ගෙන තිබුණි.

(ii) විද්‍යා පීඨයේ ලියාපදිංචි වූ සිසුන් වෙනත් විශ්වවිද්‍යාල වලට මාරු වී යාමේ ප්‍රවණතාවයක් ඉකුත් වර්ෂ තුළ දක්නට ලැබුණු අතර, එය වළක්වා ගැනීමට ප්‍රමාණාත්මක පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2014/2015 අධ්‍යයන වර්ෂයේදී සිසුන් 104 දෙනෙකු වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු වී තිබුණි

(iii) 2013 වර්ෂයේදී දේශීය ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 3 වන ස්ථානයේ සිට 2015 හා 2014 යන වර්ෂ වලදී පිළිවෙලින් 6 වන හා 4 වන ස්ථාන දක්වාද 2014 වර්ෂයේදී

ලෝක ශ්‍රේණිගත කිරීම් ලැයිස්තුවේ 2353 ස්ථානයේ සිට 2015 වර්ෂයේදී 3483 වන ස්ථානය දක්වාද පහළ බැස තිබුණි. විද්‍යා පීඨයේ ලියාපදිංචි වූ සිසුන් වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු වී යාමට ඉහත දැක්වෙන හේතු ප්‍රධාන වශයෙන් බලපා ඇති බව විගණනයේ අදහසයි.

(iv) විද්‍යාපීඨයේ ශිෂ්‍ය ධාරිතාවය සිසුන් 1270 දෙනෙකු වුවද 2015 වර්ෂය අවසානයට සිසුන් 860 ක් පමණක් බඳවාගෙන තිබීම නිසා ඒකශිෂ්‍ය පිරිවැය රු.112,091 කින් වැඩි වී තිබුණි.

(ඇ) දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය

---

(i) උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයෙකු ලියාපදිංචි වීමෙන් වර්ෂ 03 ක අධ්‍යයන කාලය තුළ තම උපාධිය අවසන් කළ යුතු වුවද 2010 හා 2009, අධ්‍යයන වර්ෂයන්හි ලියාපදිංචි වූ සිසුන්ට තම උපාධිය සම්පූර්ණ කිරීම සඳහා වර්ෂ 06ක් හෝ ඊට වඩා වැඩි කාලයක් ගත වී තිබුණු අතර විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 05 සිට මාස 23 දක්වා කාල ප්‍රමාදයන් සිදු වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) ශාස්ත්‍රවේදී උපාධි පාඨමාලාව සඳහා 2009 සිට 2012 වර්ෂය දක්වා ලියාපදිංචි වී තිබුණු ශිෂ්‍ය සංඛ්‍යාව 3010 සිට 892 ක් දක්වා සියයට 70 කින් අඩු වී තිබුණි. 2012 වර්ෂයෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රමාණවත් සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචි කරවා ගැනීමට අපොහොසත් වීම හේතුවෙන් ලියාපදිංචි විය යුතු අවසාන දිනය දින නියමයක් නොමැතිව කල් දමා තිබුණි.

(iii) අධ්‍යයන කටයුතු වල අකාර්යක්ෂමතාවය විභාග පැවැත්වීමේ හා ප්‍රතිඵල නිකුත් කිරීමේ කටයුතු වල සිදුවී තිබුණු සැලකිය යුතු කාල ප්‍රමාදයන් හේතුවෙන් මෙම ඒකකයේ ශිෂ්‍ය ලියාපදිංචිය අඩුවීමට හේතු වී තිබුණි .

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ නව උපාධි පාඨමාලාවක් හඳුන්වාදීම, වෙරළ සම්පත් පිළිබඳ දැනුවත් කිරීමේ කේන්ද්‍රයක් ස්ථාපිත කිරීම සහ විශ්වවිද්‍යාල ගම්මාන වැඩසටහන යනාදිය වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 2,512.8 ක ප්‍රතිපාදන එහි කාර්යයන් සඳහා කාර්යක්ෂමව උපයෝගී කර ගැනීම යන කාර්යයන් ඉටු කර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම නොහැකි වී තිබුණි.

(ඉ) අරමුණු ඉටු කරගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ වගකීම පීඨාධිපතිවරුන් හා අංශ ප්‍රධානීන් වෙත පවරා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුමක් හෝ කාර්යසාධන වාර්තා සකස් කර නොතිබීම හේතුවෙන් අනෙකුත් අරමුණුවල සඳහන් විවිධ ක්‍රියාකාරකම් කෙතරම් දුරට ඉටු කර ගැනීමට හැකියාව ලැබුණේද යන්න පිළිබඳ පරීක්ෂාකර තහවුරු කර ගැනීමට විගණනයට නොහැකි විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සතු දේපල සඳහා 2015 හා ඊට පෙර වර්ෂ වෙනුවෙන් නියමිත කාලපරිච්ඡේදය තුල වරිපනම් බදු නොගෙවීම හේතුවෙන් රු.133,252 ක අධිභාරයක් මාතර මහා නගර සභාවට ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) කාර්යාලීය ඉඩපහසුකම් වැඩි කිරීමේ අරමුණින් නව පරිපාලන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2014 වර්ෂයේ දී සැලසුම් කර 2016 වර්ෂයේ දී වැඩ අවසන් කළ යුතුව තිබුණද, 2016 මැයි 15 දක්වා එකී කාර්යය ආරම්භ කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සේවයෙන් ඉවත් වී ඇති ආචාර්යවරු 05 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 430,930 ක් වූ ණය හා අත්තිකාරම් අය කර ගැනීමෙන් තොරව විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් හා පාරිතෝෂික දීමනා ගෙවා තිබුණි.

(ආ) සිංහල අධ්‍යයනාංශයේ ආචාර්යවරු 05 දෙනෙකුට 2013 වර්ෂයේදී ලබා දී තිබුණ රු.1,084,145 ක පර්යේෂණ දීමනාවලට අදාළ පර්යේෂණ වාර්තා 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. මෙම ආචාර්යවරු 05 දෙනාගෙන් දෙදෙනෙකු 2014 සැප්තැම්බර් 30 දින සිට විශ්‍රාම ගොස් තිබුණු අතර, තවත් දෙදෙනෙකු අධ්‍යයන කාර්යයන් සඳහා විදේශ ගත වී තිබුණි.

(ඇ) 2014 වර්ෂය අවසානයට නොගෙවූ ශිෂ්‍යාධාර ගිණුමේ වූ රු. 8,602,050 ක ශේෂය සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 11,836,350 ක් දක්වා සියයට 37 කින් වර්ධනය වී තිබුණි. එම මුදල් රඳවා තබා ගැනීමට හේතු විගණනයට ඉදිරිපත් නොවීය.

**4.4 දෘශ්‍ය අක්‍රමිකතා**

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ධීවර හා සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය සඳහා භාණ්ඩ මිලදී ගැනීමේ පිරිවිතර අනුව BTU 24000 ක ධාරිතාවයෙන් යුතු වායු සමීකරණ යන්ත්‍ර 04 ක් සපයා සවිකිරීම වෙනුවට BTU 23500 ක ධාරිතාවයෙන් යුතු යන්ත්‍ර 04 ක් සපයා ස්ථාන 03 ක සවිකර තිබියදී නියමිත ධාරිතාවය නොසලකා එකකට රු. 97,500 ක් බැගින් එකතුව රු. 390,000 ක මුදලක් පෞද්ගලික ආයතනයකට ගෙවීම් කර තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය විසින් 2014 හා 2015 වර්ෂ දෙක තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට සක්‍රියව එකතු කළ අගය මත බදු ගෙවා නොතිබුණු ආයතන 04 කට රු. 2,742,362 ක් සහ ව්‍යාජ එකතු කළ අගය මත බදු ඉන්වොයිස් ඉදිරිපත් කල ආයතන 2 ක් වෙත රු.789,792 ක් එකතු කළ අගය මත බදු ගෙවා තිබුණු අතර එම ආයතන වලින් ඒවා ආපසු අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි.

**4.5 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) "විසිඑක්වන සියවස සඳහා උසස් අධ්‍යාපනය" ව්‍යාපෘතිය (HETC) හා රුහුණ විශ්වවිද්‍යාලය අතර බාහිර උපාධි වැඩසටහන නමින් ඇති කර තිබූ ව්‍යාපෘතිය 2016 ජනවාරි 23 දින අවසන් වීමට නියමිතව තිබුණි. ඒ සඳහා වැය යෝජනා කාර්යක්ෂමව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා ලැබී තිබුණු රු. 25,000,000 ක ප්‍රතිපාදන මුදලින් රු. 12,155,374 ක් උපයෝජනය කරගෙන නොතිබුණි.

(ආ) රුහුණ විශ්වවිද්‍යාලය සහ බෙල්ජියම් Vrije විශ්වවිද්‍යාලය අතර ඇති කර ගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ වර්ෂ 05 ක කාල පරිච්ඡේදය තුළ "හරිත දියබාධකය" (Green Dyke) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු. 22,840,222 ක මුදලක් ලබා දී තිබුණි. අදාළ කාලය තුළ ව්‍යාපෘතියේ කටයුතු අවසන් නොකිරීම නිසා උපයෝජනය නොකරන ලද රු. 9,293,549 ක මුදල 2016 පෙබරවාරි 24 දින Vrije විශ්වවිද්‍යාලය වෙත ආපසු යැවීමට සිදු වී තිබුණි.

(ඇ) දිගුකාලීන ආයෝජන යටතේ දැක්වෙන සංවර්ධන අරමුදල්, ස්ථාවර තැන්පතු හා ඉතිරිකිරීමේ ගිණුමක සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු. 1,642,389 ක් වූ ශේෂ සංවර්ධන අරමුදලේ අරමුණු සඳහා උපයෝජනය නොකර දීර්ඝ කාලයක සිට නිෂ්කාර්යව රඳවාගෙන තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ත්‍යාග හා පරිත්‍යාග ගිණුම් 10 කට අදාළ එකතුව රු.50,593,597 ක මුදලක් වර්ෂ 3 සිට වර්ෂ 10 දක්වා කාලපරිච්ඡේදය තුළ අරමුණුගත කාර්යයන් සඳහා යොදවා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) ප්‍රාග්ධන වියදම් සඳහා රජයෙන් ලබාදුන් ප්‍රාග්ධන ප්‍රදාන අදාල කාර්යය සඳහා යොදාගෙන නොතිබූ බවත් එම මුදල නිෂ්ක්‍රීය මුදල් වශයෙන් තබාගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය අවසානයේ එසේ උපයෝජනය නොකල රාජ්‍ය ප්‍රදාන ප්‍රමාණය රු.102,648,284 ක් විය.

(ඊ) ආදායම් ගිණුමෙන් දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ අරමුදල් ගිණුමට මාරුකර තිබුණු එකතුව රු. 47,115,612 ක මුදලක් වර්ෂ 3 ක සිට අරමුදලේ අරමුණු සඳහා වැය නොකර ඉදිරියට ගෙනෙවිත් පැවතුණි. සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ දෙකේදී ආදායම් ගිණුමෙන් මෙම ගිණුමට කිසිදු මුදලක් මාරු කර නොතිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මානව ශාස්ත්‍ර හා සමාජයීය විද්‍යාපීඨයේ ආචාර්යවරුන්ට රු. 527,520 ක වියදමින් ලබා දී තිබුණු ලැප්ටොප් පරිගණක 4 ක්, කෘෂි ඉංජිනේරු අධ්‍යයන අංශයට මිල දී ගෙන තිබුණු රු. 2,249,500 ක් වටිනා ලේත් යන්ත්‍රයක් (Lathe Machine) හා මාගම්පුර බහු විෂයික අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානය වෙත ලබා දී තිබුණු රු. 1,162,500 ක් වටිනා පරිගණක යන්ත්‍ර 15 ක් 2015 ඔක්තෝබර් 26 දින වන විට වගකීම් කාලය ද ඉක්මවා වසර 02 කට ආසන්න කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) 2013 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් විසින් පවරා දෙන ලද රුහුණ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මාගම්පුර බහු විෂයයික අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයේ වායු සමනය කරන ලද හා ටයිල් අතුරන ලද වර්ග අඩි 5944ක ඉඩ ප්‍රමාණයකින් යුතු දර්ශනීය ගොඩනැගිලි සංකීර්ණය කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොගෙන වසාදමා තිබුණි.

(ඇ) කොස්පැලවත්ත කාර්ය මණ්ඩල නිවාස සංකීර්ණයේ රු. 3,622,242 ක වියදමින් ඉදිකර තිබුණු දිවා සුරකුම් මධ්‍යස්ථානය 2014 ඔක්තෝබර් මාසයේ සිට කිසිදු ප්‍රයෝජනයකට යොදා නොගෙන වසාදමා තිබුණි.

(ඈ) ඉංජිනේරු පීඨයේ විද්‍යුත් හා තොරතුරු අධ්‍යයනාංශයේ පරිගණක ඒකකය සඳහා 2014 නොවැම්බර් 04 දින පෞද්ගලික ආයතනයකින් රු. 463,000 ක වියදමින් පරිගණක මේස 60 ක් මිලදී ගෙන තිබුණු නමුත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම මේස වලින් 47 ක් ප්‍රයෝජනයට නොගෙන පරිගණක ඒකකයට ඇතුලුවන ස්ථානයේ අනාරක්ෂිතව ගොඩගසා තිබුණි. එසේම එම ඒකකය සඳහා ඉදිකිරීමට සැලසුම් කර තිබුණු ශ්‍රව්‍ය දෘෂ්‍ය විද්‍යාගාරය 2016

ජනවාරි වන විටත් ඉදි නොකිරීම හේතුවෙන්, එම විද්‍යාගාරය සඳහා 2015 අප්‍රේල් 08 දින අධ්‍යයනාංශයට ලැබී තිබුණු රු. 5,645,536 ක් වටිනා උපකරණ 2016 ජනවාරි 28 දින වන විටත් ප්‍රයෝජනයට ගැනීමට නොහැකිවී තිබුණි.

**4.7 ආර්ථික නොවූ ගනුදෙනු**

උසස් අධ්‍යාපන පාඨමාලා හැදෑරීම වෙනුවෙන් ආචාර්යවරුන් 04 දෙනෙකු සඳහා රු.11,341,000 ක මුදලක් අනුමත කර තිබුණි. ඔවුන්ගේ අධ්‍යයන නිවාඩු කාලය 2015 ඔක්තෝබර් 01 දිනෙන් අවසන් වී තිබුණද, 2016 පෙබරවාරි 19 දින වන විටත් තම උසස් අධ්‍යාපන පාඨමාලා වලට අදාලව සිදුකළ ශාස්ත්‍රීය නිබන්ධන ඉදිරිපත් කර නොතිබුණි.

**4.8 හඳුනාගන්නා ලද පාඩු**

අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා නොගෙන රසායන ද්‍රව්‍ය මිල දී ගැනීම හේතුවෙන් රසායන ද්‍රව්‍ය 31 කට අදාළ රු. 380,117 ක තොග සමාලෝචිත වර්ෂයේ අවසානයට කල් ඉකුත් වී තිබුණි. එසේම රු. 313,363 ක් වටිනා රසායන ද්‍රව්‍ය 23 ක්, වටිනාකම අනාවරණය නොවූ රසායනික ද්‍රව්‍ය 8 කට අදාළව කිලෝ ග්‍රෑම් 231 ක් හා තවත් රසායන ද්‍රව්‍ය ලීටර් 20 ක් වසර 01 සිට වසර 06 දක්වා කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර ඇති බව අධ්‍යනාංශ දෙකක සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

**4.9 කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 නොවැම්බර් 20 දින නිමකළ යුතුව තිබුණු කර්මාන්ත 08 ක් අතරින් කර්මාන්ත 04 ක භෞතික ප්‍රගතිය සියයට 15 සිට සියයට 50 මට්ටමේ පැවතුණු අතර, තවත් කර්මාන්තයක භෞතික ප්‍රගතිය ශුන්‍ය අගයක් ගෙන තිබුණි. මෙම කර්මාන්ත 08 සඳහා වර්ෂය තුළ ලැබී තිබුණු රු. 283,000,000 ක ප්‍රතිපාදන වලින්, 2015 නොවැම්බර් 20 දින වන විට වැයකර තිබුණේ රු.95,550,000 ක් පමණි. ඒ අනුව කර්මාන්ත වල මූල්‍ය ප්‍රගතිය සියයට 34 ක් තරම් පහල අගයක් ගෙන තිබුණි.

(ආ) කළමනාකරණ හා මූල්‍ය පීඨය සඳහා ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු 2014 දෙසැම්බර් 17 දිනට අවසන් කළ යුතුව තිබුණු නමුත්, 2015 නොවැම්බර් 20 දින වන විට එකී ඉදිකිරීම් වල භෞතික ප්‍රගතිය සියයට 68 ක් විය. ඉදිකිරීම් කටයුතු වල ප්‍රමාදය සඳහා කොන්ත්‍රාත්කරුගෙන් රු. 12,970,908 ක ප්‍රමාද ගාස්තු අය කරගෙන තිබුණද, පසුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් අනුමත කර අයකර ගත් මුදල් ආපසු කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

**4.10 ප්‍රමාද වූ ව්‍යාපෘති**

ඉංජිනේරු පීඨයේ විද්‍යුත් හා තොරතුරු අධ්‍යයනාංශයේ පරිගණක ඒකකය නවීකරණය කිරීම සඳහා 2015 ජනවාරි 05 දින පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු සමඟ රු. 3,346,168 ක ගිවිසුමකට එළඹී තිබුණි. වැඩ වලින් කොටසක් පමණක් ඉටු කර 2015 සැප්තැම්බර් 17 දින වනවිට කොන්ත්‍රාත්කරු කර්මාන්තය අතහැර දමා තිබුණි.

**4.11 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) <u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

ඉංජිනේරු පීඨයට අනුමත මහාචාර්ය තනතුරු 05 ම පුරප්පාඩු වී පැවතුණු අතර පීඨ 07 හිම කථිකාචාර්ය තනතුරු 148 ක පුරප්පාඩු පැවතුණි. ඉන් වෛද්‍ය, ඉංජිනේරු සහ විද්‍යා යන පීඨවල පුරප්පාඩු ප්‍රමාණය පිළිවෙළින් 41 ක් , 34 ක් හා 23 ක් තරම් ඉහළ අගයන් ගෙන තිබීමෙන් එම පීඨවල අධ්‍යාපනය ලබන සිසුන්ට ඵලදායී අධ්‍යපනයක් ලබා දීමට බාධාවක් වී තිබුණි.

(ආ) <u>අනධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

(i) අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරු 13 කද, මාණ්ඩලික නොවන ශ්‍රේණියේ තනතුරු 50 ක හා සුළුසේවක කාර්ය මණ්ඩලයේ තනතුරු 104 ක පුරප්පාඩු පැවතුණි.

(ii) දෙපාර්තමේන්තු සහ අංශ අතර ස්ථාන මාරු ක්‍රමයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් වෛද්‍ය පීඨයේ විවිධ දෙපාර්තමේන්තු හා අංශවලට අයත් ලිපිකරු හා සමාන්තර සේවා තනතුරුවල කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 26 දෙනෙකු වසර 05 සිට වසර 32 ක් අතර කාල පරිච්ඡේදයක් එකම අංශයක සේවය කරන බව නිරීක්ෂණය විය.

(iii) කෘෂිකර්ම විද්‍යාපීඨයේ ආහාර හා තාක්ෂණ අධ්‍යයනාංශයට අනුයුක්තව සිටි තාක්ෂණ නිලධාරිනිය 2013 ඔක්තෝබර් 28 දින සිට අනුමත තනතුරක් නොමැති එම පීඨයේ පරිගණක ඒකකයට අනුයුක්ත කර තිබීමෙන් අධ්‍යනාංශයේ ඇති වූ පුරප්පාඩුව සඳහා එම අංශයට අනුයුක්ත කම්කරුවකු සේවයේ යොදවා තිබුණි. ඒ හේතුවෙන් අධ්‍යයනාංශයේ ප්‍රායෝගික පරීක්ෂණ සඳහා වසර දෙකකට වැඩි කාලයක සිට තාක්ෂණ නිලධාරියෙකුගේ ගුණාත්මක සේවය අහිමි වී තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 5.1 ක්‍රියාකාරී සැලැස්ම

--------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

### 5.2 විගණන හා කළමනාකරණ කමිටු

-----------------------------------------

2010 දෙසැම්බර් 14 දිනැති අංක පීඊඩී/55 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි.

### 5.3 අයවැය ලේඛනමය පාලනය

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය වියදම් අතර සියයට 15 සිට සියයට 193 ක පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

### 5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

2012 හා 2013 වර්ෂ දෙක සඳහා වූ වාර්ෂික වාර්තා 2016 අප්‍රේල් 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.5 නොවිසඳී ඇති විගණන ඡේද

ඉකුත් වර්ෂවල විගණකාධිපති වාර්තා මගින් පෙන්වා දී තිබුණු නමුත්, පහත විස්තර දැක්වෙන විගණන ඡේද කෙරෙහි විශ්වවිද්‍යාලයේ ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(අ) (i) ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය මගින් 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර තිබුණු Specific Agreement on Research Co-operation Between the Swedish International Development Co-operation Agency ව්‍යාපෘතිය යටතේ උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර ගැනීම සඳහා තාවකාලික කථිකාචාර්යවරයෙකුට සහ ස්ථිර කථිකාචාර්යවරයෙකුට කිසිදු ඇප බැඳුම්කරයකට එළඹීමෙන් තොරව එකතුව රු. 1,740,622 ක මූල්‍යාධාර සපයා තිබුණි.

(ii) එම කථිකාචාර්යවරුන් දෙදෙනාම දැනට විශ්වවිද්‍යාලයේ සේවය නොකරන අතර, උසස් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරන ලද බව තහවුරු කෙරෙන කිසිදු සාක්ෂියක්ද නොවීය. ඒ අනුව දරන ලද වියදමට කිසිදු ප්‍රතිලාභයක් විශ්වවිද්‍යාලයට ලැබී නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) (i) කෘෂිකර්ම විද්‍යා පීඨයේ ආහාර හා තාක්ෂණ විද්‍යා අධ්‍යයනාංශය සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ ජර්මනියේ ආයතනයකින් මිලදී ගැනීම සඳහා වසර 04 කට පෙර රු.751,463 ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. අදාල උපකරණ විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණු නමුත්, ඒ පිළිබඳව 2014 වර්ෂයේ මාර්තු දක්වා කිසිදු පසු විපරම් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ii) නැවත අධ්‍යයනාංශය සඳහා අවශ්‍ය උපකරණ ඉන්දියාවේ ආයතනයකින් රු. 329,179 ක වියදම් දරා ආනයනය කර තිබුණු අතර, ඇණවුම් නොකරන ලද උපකරණ ද, එම ආයතනය විසින් සපයා තිබුණි. තවත් කොටසක් ලැබී නොතිබුණි. විවිධ අඩුපාඩු සහිත උපකරණ විශ්වවිද්‍යාලයට ලැබී වසරකට වැඩි කාලයක් ගත වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 5.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටු කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ පිහිටි ආපනශාලා 8 න් සහ පවිත්‍රතා සේවා සපයන ආයතනය විසින් බැහැර කරනු ලබන ඝණ අපද්‍රව්‍ය ඇතුළු විවිධ වර්ගයේ කසල වැල්ලමඩම පාලම අසල කලපුවට බැහැර කර තිබුණි. විවිධ පාරිසරික ප්‍රශ්න උද්ගත වීම හේතුවෙන් එම ස්ථානයට කසල බැහැර කිරීම 2016 මැයි 30 දිනෙන් පසුව තහනම් කර තිබුණි.

(ආ) ප්ලාස්ටික් හා පොලිතීන් භාවිතය නිසා සිදුවන ඍජු හා වක්‍ර සෞඛ්‍ය, පාරිසරික හා සමාජීය බලපෑම අවම කරගැනීම සඳහා රාජ්‍ය ආයතන සම්බන්ධ කරගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකිව තිබුණද, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ඇ) දැනට තහනම් කර ඇති මයික්‍රෝන 20ට අඩු පොලිතීන් බෑග් හා ආහාර දැවටුම් විශ්වවිද්‍යාලය තුළ තහනම් කිරීම, මයික්‍රෝන 20 ට වැඩි පොලිතීන්, අනෙකුත් ද්‍රව්‍ය හා ප්ලාස්ටික් රැගෙන ඒම පාලනය කිරීම සහ ප්ලාස්ටික් හා පොලිතීන් වෙනුවට වෙනත් ඇසුරුම් ක්‍රමවේද කෙරෙහි කාර්ය මණ්ඩලය හා සිසුන් දිරි ගැන්වීම වැනි පරිසර හිතකාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශ්වවිද්‍යාලයේ අවධානය යොමු වී නොතිබුණි .

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම, නිෂ්කාර්යව පවතින ස්ථාවර වත්කම් සම්බන්ධව ක්‍රියාමාර්ග නොගැනීම |
| (ආ) ගිණුම්කරණය | තොග හා ඉදිකිරීම් නිම වූ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) මූල්‍ය පාලනය | අරමුණුගත කාර්යයන් සඳහා උපයෝජනය නොකර බැංකු ගිණුම් වල මුදල් රඳවා තබා ගැනීම. |
| (ඈ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු නොකිරීම. |
| (ඉ) කොන්ත්‍රාත් පරිපාලනය | කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධයෙන් මනා අධීක්ෂණයක් සිදු නොවීම. |
| (ඊ) වාහන පාලනය | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකිරීම, දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ සම්පූර්ණ කර විගණකාධිපති වෙත ඉදිරිපත් නොකිරීම. |
| (උ) මෙහෙයුම් පාලනය | අරමුණුගත කාර්යයන් සම්පූර්ණ කර නොගැනීම හා සැලසුම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ අකාර්යක්ෂමතාවයන් සිදුවී තිබීම. |